# ලංකා විදුලිබල මණ්ඩලය
# නැගෙනහිර පළාත සඳහා
# භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් හා
# කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2021

2021 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ නැගෙනහිර පළාත සඳහා අයත් භාණ්ඩ හා සේවා සැපයීම වෙනුවෙන් අලුතින් ලියාපදිංචි වීමට කැමති පිළිගත් භාණ්ඩ නිපදවන්නන් , බෙදාහරින්නන් , නියෝජිතයින් , සැපයුම්කරුවන්,කොන්ත්‍රාත්කරුවන් හා සේවා සපයන්නන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයිතම් වර්ගය**

**01.භාණ්ඩ සැපයීම**

| සංකේතය | භාණ්ඩ වර්ගය |
|---|---|
| M-1 | අරුකපු සැරිසිදු, සිගිති සැරිසිදු,සහ සිදහලු (නියෝජිතයන්ගෙන් පමණි) |
| M-2 | බැහැවුම් පුලුසු සහ අ.බා.ධ පුලුසු (නියෝජිතයන්ගෙන් පමණි) |
| M-3 | දෙලෝහ බදවන ,වෙනුල, තෙරුපි සබදන සහ ඇලුමිනියම් පොදි බහන් උපාංග (නියෝජිතයන්ගෙන් පමණි) |
| M-4 | ආරක්ෂිත උපකරණ සහ කුඩා ආම්පන්න (නියෝජිතයන්ගෙන් පමණි) |
| M-5 | තඹ සහ ඇලුමිනියම් කේබල් පිරියවන සහ ගැ.ය. බැඳුම් තත් |
| M-8 | මනුරු පෙට්ටි (දැව,ප්ලාස්ටික්,ලෝහ) |
| M-11 | කොන්ක්‍රීට් කණු පෙරදි සහ වැර කැවූ කොන්ක්‍රීට් කණු |
| M-12 | පරිගණක සහ පරිගණක සඳහා මුද්‍රණ යන්ත්‍ර, පරිගණක ජාල හා ඊට අදාල උපාංග |
| M-13 | විදුලි උපකරණ, හැලජන් ගැලපී වීදි ලාම්පු, වීදි ලාම්පු සහ ගැලපී ප්‍රධාන වහරු හා අනෙකුත් විදුලි උපාංග |

**02.සේවා සැපයීම**

| සංකේතය | භාණ්ඩ වර්ගය |
|---|---|
| S-1 | භාණ්ඩ ප්‍රවාහනය පිණිස කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම. |
| S-2 | සේවා සම්බන්ධතා සැපයුම් පිණිස කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම. |
| S-3 | මංවර හෙළි කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම. |
| S-4 | මධ්‍යම වෝල්ටීයතා සහ අඩු වෝල්ටීයතා මාර්ග උප පොළ වල සහ සේවා සැපයුම් ලබා ගැනීම පිණිස කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම. |
| S-5 | පුනරුත්ථාපන කටයුතු ,මධ්‍යම වෝල්ටීයතා සහ අඩු වෝල්ටීයතා මාර්ග උප පොළ වල සහ සේවා සැපයුම් සඳහා ද වර්ධනයන් සිදු කිරීම පිණිස කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම. |
| S-9 | ලිපිද්‍රව්‍ය මුද්‍රණය කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම. |
| S-12 | ගොඩනැඟිලි තැනීම් සඳහා සිවිල් වැඩ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම. |
| S-15 | තොග සැපයුම්, සූර්ය බලශක්ති හා සාමාන්‍ය සැපයුම් ස්ථාන සඳහා වරලත් ඉංජිනේරුවරුන් විසින් පරීක්ෂා කර අදාල වාර්තා සැපයීම සඳහා ලියාපදිංචි කර ගැනීම. |

**අයදුම්කරුවන් සඳහා උපදෙස්**

01. 2020 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයීමට ලියාපදිංචි වූ සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් හට එම භාණ්ඩ හා සේවා සැපයීම සඳහා 2021 වර්ෂය සඳහා ලියාපදිංචි කිරීමේ ලියකියවිලි මිලදී ගැනීමක් අවශ්‍ය නොවේ. ඔවුන් 2021 වර්ෂය සඳහා ද ලියාපදිංචි වීමට කැමැත්තේ නම් ඒ සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නැගෙනහිර) වෙත ලිඛිත ඉල්ලීමක් කළ යුතුය. පෙර සේවා සතුටුදායක සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් 2021 වර්ෂය සඳහා ද අදාළ භාණ්ඩ / සේවා කාණ්ඩය යටතේ ලියාපදිංචි කිරීමට කටයුතු කරනු ඇත.

02. 2020 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයීමට ලියාපදිංචි වූ සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් 2021 වර්ෂය සඳහා වෙනත් භාණ්ඩ හා සේවා සැපයීමක් සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය නම්, ඔවුන් එයට අදාල 2021 වර්ෂයේ නව භාණ්ඩ හා සේවා සඳහා සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ලියකියවිලි මිලදී ගෙන අයදුම්පත් නිසි පරිදි සකස් කර භාර දිය යුතුය.

03. එක් එක් භාණ්ඩ /සේවා කාණ්ඩය සඳහා ද වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

04. අදාල අයදුම්පත් කට්ටල 2020-11-10 වන දින දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නැගෙනහිර) කාර්යාලයෙන් (ලිපිනය පහත දක්වා ඇත) සතියේ වැඩ කරන දින වල පෙ.ව.09.00 සිට ප.ව.03.00 දක්වා ලබාගත හැකිය. අදාල එක් එක් අයදුම්පත සඳහා ආපසු නොගෙවන ලබන රු.500.00 ක වටිනාකමකින් යුතු "සාමාන්‍යාධිකාරි ලංකා විදුලිබල මණ්ඩලය" නමට ලියන ලද බැංකු අණකරයක් මඟින් හෝ ලංකා විදුලිබල මණ්ඩලය මඟින් නිකුත් කරනු ලබන ගෙවීම් වවුචරයක් මඟින් ගෙවීම් කළ යුතුය.

05. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නැගෙනහිර) කාර්යාලය වෙත ලියාපදිංචි තැපැලෙන් 2020-11-11 වන දින ප.ව.02.00ට පෙර ලැබෙන පරිදි එවීමට හෝ අතින් ගෙනැවිත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නැගෙනහිර) කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතුය. අයදුම්පත සහිත ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ "Registration of Suppliers & Contractors - 2021 සහ අදාල කාර්යය සංකේත අංකය සමඟ (Category with code)" සඳහන් කළ යුතුය.

06. 2020-11-11 වන දින ප.ව.02.00 න් පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලබන අතර , ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. අයදුම්පත් කට්ටල සහ මේ පිළිබඳ වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් ලබා ගත හැක.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නැගෙනහිර),**
**ලංකා විදුලිබල මණ්ඩලය,**
**උප්පුවේලි,**
**ත්‍රිකුණාමලය.**

**දුරකථන අංකය : 026-2222666 / 026-2221030**
**ෆැක්ස් අංකය : 026-2222158 / 026-2226908**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

**විදුලිබලයෙන් සසිරිමත් දිවියක්**